# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව

சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்

**Department of Samurdhi Development**

සමාජ සවිබලගැන්වීම්, සුබසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය

சமூக வலுவூட்டல் நலன்புரி மற்றும் கண்டி மரபுரிமைகள் அமைச்சு

**MINISTRY OF SOCIAL EMPOWERMENT, WELFARE AND KANDYAN HERITAGE**


2018.03.05

චක්‍රලේඛ අංක **2018/MF/02**

**සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්/දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,**

**දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්, ප්‍රාදේශීය ලේකම්වරුන්,**

**සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති කළමනාකරුවන්,**

**සමෘද්ධි ප්‍රජාමූල බැංකු කළමනාකරුවන් වෙත.**

## සමෘද්ධි ප්‍රජාමූල බැංකු ඇගයීම හා ශ්‍රේණිගත කිරීමේ වැඩසටහන - 2017

## 1. හැඳින්වීම :

සමෘද්ධි ප්‍රජා මුල බැංකු ඇගයීම හා ශ්‍රේණිගත කිරිමේ වැඩසටහන අංක 2016/12 හා 2016/12/31 දිනැති චක්‍රලේඛයේ සදහන් පරමාර්ථ හා අරමුණු පෙර දැරිව 2017 වර්ෂය සදහා ද සමෘද්ධි බැංකු ඇගයීම හා ශ්‍රේණිගත කිරීම සදහා බලපාන නිර්නායකයන් හා ඒ හා බැඳි ක්‍රමවේදය හදුන්වා දිම මෙමගින් අපේක්ෂා කෙරේ. ඒ අනුව පහත සදහන් අන්තර්ගතයන් සම්බන්ධව අදාල පාර්ශවයන් දැනුවත් කරනු ඇත.

### 1.1 අන්තර්ගතයන් :

(i) ඇගයීම කාල පරාසය - 2017/01/01 සිට 2017/12/31 දක්වා.

(ii) වැඩසටහනට ඉලක්කගත බැංකු ඇතුලත් වීම - 2017/01/01 සිට 2017/12/31 දක්වා ක්‍රියාත්මක වු සියළුම සමෘද්ධි ප්‍රජාමූල බැංකු ඊට ඇතුලත් වන අතර , ඒ හා බැඳි අනු විෂය ක්ෂේත්‍රයන්ද ( ඉදිරි ඡේදයකදි හදුන්වා දෙනු ලබන) ඇගයීම් සදහා යොදා ගනු ඇත.

(iii) **ඇතුලත් වීමේ කොන්දේසි -**

**සමස්ථ සමෘද්ධි බැංකු පද්ධතියේ ඒ ඒ බැංකු අඩු ආදායම්ලාභි ප්‍රජාවගේ ආර්ථික සවිබලකරණයට හා මානසික සවිබලකරණයට සිදුකරන ලද දායකත්වය සලකා ප්‍රාදේශිය හා දිස්ත්‍රික් ශ්‍රේණිගත කිරීම සිදු කරනු ලබන අතර, ජාතික ඇගයීම් වලදී පහත සදහන් අවස්ථා සහිත බැංකු ඇතුලත් නොවේ.**

(අ) බැංකුවේ සියළුම ගිණුම්හි ශේෂ පිරික්සුම් හා පොදු ලෙජර තුලනය නොවූ බැංකු.

(ආ). 2017 වර්ෂයේ අලාභදායී බැංකු.

(ඇ) විවිධ හේතූන් මත මූල්‍ය කටයුතු පිළිබඳ කුමන හෝ පරීක්ෂණයන් සිදුවෙමින් පවතින බැංකු

(ඈ) කිසියම් බැංකුවක් විසින් බොල් ණය ආපසු අයකර ගැනීම සඳහා, නව ණයක් නිකුත් කර බොල්ණය පියවා ගෙන ඇත්නම් එවැනි බැංකු ඇගයීම් කටයුතු සඳහා අදාල කර නොගත යුතුය.




**1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla**

| | | | | | |
|---|---|---|---|---|---|
| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අධ්‍යක්ෂ (මානව සම්පත්)<br>பணிப்பாளர் ( மனிதவளம்)<br>Director (Human Resource) | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி )<br>Director ( Micro Finance) | කාර්යාලය<br>அலுவலகம்<br>Office |
| Tel- | 011-2871672/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | **Hot Line: 011- 2887722** |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | **Hot Line:0112-885582** | |
| | | **Hot Line :0112-889007** | | | |

### 1.2 ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්ෂුද්‍ර මූල්‍ය අංශයේ කළමනාකරණ තොරතුරු ඒකකය මගින් හඳුන්වා දෙනු ලබන නිර්ණායකයන් මත පිහිටා එම නිර්ණායක අනුව ගනු ලබන ලකුණු පදනම් කර ගෙන සමෘද්ධි ප්‍රජා මූල බැංකු ඇගයීම හා ශ්‍රේණිගත කිරිම සිදු කරනු ඇත.

## 2 නිර්ණායක හඳුන්වාදීම

2017 වර්ෂයේද සමෘද්ධි ප්‍රජා මූල බැංකු ශ්‍රේණිගත කිරිම හා ඇගයීම් වැඩසටහනෙහි නිර්ණායක හඳුන්වා දීම 2016/12/31 දිනැතිව නිකුත් කරන ලද අංක 2016/12 චක්‍රලේඛයේ 2.0 ඡේදය හා ප්‍රජාමූල කළමනාකරණ මණ්ඩලයේ උපදෙස් පරිදි සිදුකරන ලද වෙනස්කම් සහිතව මෙවර වැඩසටහන සඳහා නිර්ණායකයන් හඳුන්වා දීම සිදු කර ඇත. ඒ අනුව බැංකුවේ අරමුණු මිණුම් කෙරෙන ආකාරයට නිර්ණායකයන් ගලපා ඇත. හා

### 2.1 සමෘද්ධි ප්‍රජා මූල බැංකුව ශ්‍රේණිගත කිරීමේ නිර්ණායක

සමෘද්ධි ප්‍රජාමූල බැංකු ශ්‍රේණිගත කිරීමේ ක්‍රියාවලියේ දී ක්ෂේත්‍ර 05 ක් යටතේ බැංකුව මිනුම් කරනු ලැබේ. බැංකුවට ලබා ගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය 500 කි .පහත විෂය ක්ෂේත්‍රයන්හි වැදගත්කම අනුව බර තබනු ලබන ලකුණු ප්‍රමාණය තීරණය කර ඇති අතර , එක් එක් විෂය සඳහා ලබා දෙනු ලබන ලකුණු ප්‍රමාණය පහත විස්තර කර ඇත

| | | |
|---|---|---|
| 1. තැන්පතු | - | ලකුණු 125 |
| 2. ණය | - | ලකුණු 135 |
| 3. අවධානම් කළමනාකරණය | - | ලකුණු 125 |
| 4. ලාභදායීත්වය | - | ලකුණු 80 |
| 5. බැංකු පරිශ්‍රය | - | ලකුණු 35 |
| මුළු එකතුව | - | ලකුණු 500 |

#### 2.1.1 තැන්පතු - මුළු ලකුණු - 125

| | | |
|---|---|---|
| i. දිගු කාලීන තැන්පතු ( ළමා , සිසුරක ) | - | ලකුණු 20 |
| ii. සාමාන්‍ය තැන්පතු ( සාමාජික නොවන,දිරිය මාතා ) | - | ලකුණු 32 |
| iii. සජිවිකරණ තැන්පතු (කණ්ඩායම් ) | - | ලකුණු 30 |
| iv. කොටස් ප්‍රාග්ධනය | - | ලකුණු 35 |
| v. සාමාජික තැන්පතු | - | ලකුණු 08 |

#### 2.1.2 ණය - මුළු ලකුණු - 135

| | | |
|---|---|---|
| i. පිටහිටි ණය මුදල | - | ලකුණු 60 |
| ii. ණය මුදලේ වර්ධනය | - | ලකුණු 50 |
| III. ණය සංඛ්‍යාවේ වර්ධනය | - | ලකුණු 10 |
| IV. ණයකරුවන් අනුපාතය | - | ලකුණු 15 |

**2.1.3 අවදානම් කළමනාකරණය - මුළු ලකුණු - 125**

(I) **ණය අවදානම් කළමනාකරණය - ලකුණු 40**

- කල් පසු වූ ණය අනුපාතය - ලකුණු 15
- බොල් ණය අනුපාතය - ලකුණු 10
- සම්බන්ධිත පාර්ශව වෙත ණය ලබා දීම - ලකුණු (-)
- බොල් ණය සඳහා වෙන් නොකිරීම් - ලකුණු (-)
- බොල් ණය ආපසු අයකර ගැනීම් - ලකුණු 15

(II) **ද්‍රවශීලතා අවදානම් කළමනාකරණය - මුළු ලකුණු 15**

- ද්‍රවශීලතා අනුපාතය - ලකුණු 05
- ණය තැන්පතු අනුපාතය - ලකුණු 10

(III) **මෙහෙයුම් අවධානම් කළමනාකරණය - මුළු ලකුණු 70**

- මෙහෙයුම් කාර්යක්ෂමතාව - ලකුණු 30
- ලිපි ගොනු කරණය - ලකුණු 25
- තොරතුරු කළමනාකරණය - ලකුණු 15

**2.1.4 ලාභදායිත්වය - මුළු ලකුණු 80**

i. කාලය තුල උපයාගත් ලාභය - ලකුණු 35
ii. ආදායම තුල ණය පොලී ආදායම - ලකුණු 20
iii. වත්කම් මත ගලපන ලද ප්‍රතිලාභ අනුපාතය (AROA) - ලකුණු 10
iv. කොටසක ඉපයීම් අනුපාතය - ලකුණු 05
v. බැංකුවේ මූල්‍ය තිරසාර බව (ශුද්ධ මූල්‍ය වත්කම්/බාහිර වගකීම්) - ලකුණු 05
vi. මුළු ආදායමින් කාර්යය මණ්ඩල වියදම් අනුපාතය - ලකුණු 05

**2.1.5 බැංකු පරිශ්‍රය - මුළු ලකුණු 35**

- චක්‍රලේඛ උපදෙස් පරිදි සකස් කල නාම පුවරු ප්‍රදර්ශනය - ලකුණු 05
- චක්‍රලේඛ උපදෙස් පරිදි තීන්ත ආලේපනය - ලකුණු 05
- බැංකු ගොඩනැගිලි නඩත්තුව හා ආරක්ෂණ විධිවිධාන (තාප්පය/ වැට ස්ථිර අවධානම් රහිත ගොඩනැගිල්ලක් වීම) - ලකුණු 05
- ගෙවත්ත පිරිසිදුව තබා ගැනීම හා ගෙවතු අලංකරණය - ලකුණු 05
- ගණුදෙනුකරුවන් හා ප්‍රජා නායකයින් සුහද ශිලිව පිළිගැනීම සඳහා ගෙන ඇති පියවර(ආසන පහසුකම්,බීම සඳහා ජලය, වැසිකිලි පහසුකම් , පුවත්පත්, රූපවාහිනි) (එක් කරුණකට ලකුණු 2.5 බැගින් ) - ලකුණු 10
- චක්‍රලේඛ ප්‍රකාරව අනවශ්‍ය දෑ ඉවත් නොකිරීම - (-1)
- මූලික තොරතුරු ප්‍රදර්ශනය (ගනුදෙනුකරුවන් දැනුවත් විය යුතු මූලික දත්ත ප්‍රදර්ශනය - තැන්පතු වර්ග, ණය වර්ග, පොලී අනුපාත, ණය සීමා, ප්‍රධාන කාර්යාලයේ ක්ෂණික දුරකථන අංකය) එක් කරුණකට ලකුණු 1 බැගින් උපරිම - ලකුණු 05

**3.** තැන්පතු **:- මුළු ලකුණු 125**

සමෘද්ධි ප්‍රජාමූල බැංකුවේ මේ වන විට පවත්වාගෙන යනු ලබන අනිවාර්ය ඉතුරුම් හැර අනෙකුත් ස්වේච්ඡා ඉතුරුම් මේ යටතේ සලකා බලනු ලැබේ. මෙහිදි **අක්‍රිය ගිණුම්** සංඛ්‍යාව ගණනය කිරීම්වලදී සැලකිල්ලට නොගැනේ. ඒසේ වුවද ඊට අදාල **තැන්පතු ප්‍රමාණය** මුළු තැන්පතු ගණනයේදී සලකා බලනු ලැබේ. අරමුදල් සම්පාදනයේදි ඒ ඒ තැන්පතු වර්ගයන් සමස්ථ තැන්පතු ප්‍රමාණයට ලබා දුන් දායකත්වය සලකා බර තබන ලද ලකුණු ප්‍රමාණය තීරණය කර ඇත.

3.1 දිගුකාලීන තැන්පතු **(ළමා, සිසුරක) - ලකුණු 20**

3.1.1 **සමුච්චිත තැන්පතු මුදල - ලකුණු 10**

සමුච්චිතව රැස්කරගෙන ඇති දිගුකාලීන තැන්පතු මුදල රු.මිලියන 1 ක් හෝ ඊට අඩු නම් ලකුණු 1.5 කි. ඊට වැඩි වන සෑම මිලියන 1ට ලකුණු 1.5 බැගින් **උපරිම ලකුණු 10 කි.**

<u>මුළු සමුච්චිත **දිගුකාලීන** තැන්පතු මුදල</u>
රුපියල් මිලියන 1

3.1.2 **තැන්පතු මුදලේ වර්ධනය - ලකුණු 5**

කාලය තුල දිගුකාලින තැන්පතු මුදලේ වර්ධන ප්‍රතිශතය 10%ක් හෝ ඊට අඩු නම් ලකුණු 1.5 බැගින් ඊට වැඩි වන සෑම 10%ට ලකුණු 1.5 බැගින් **උපරිම ලකුණු 5 කි**

තැන්පතු මුදලේ වර්ධනය <u>=(2017 සමුච්චිත **දිගුකාලීන** තැන්පතු මුදල-2016 සමුච්චිත **දිගුකාලීන** තැන්පතු මුදල )</u> × 100%
2016 සමුච්චිත **දිගුකාලීන** තැන්පතු මුදල

3.1.3 තැන්පතු ගිණුම් සංඛ්‍යාවේ වර්ධනය - ලකුණු 5

කාලය තුල දිගුකාලින තැන්පතු ගිණුම් සංඛ්‍යාවේ වර්ධන ප්‍රතිශතය3.5% ක් හෝ ඊට අඩු නම් ලකුණු 1කි. ඊට වැඩි වන සෑම 3.5% ට ලකුණු 1 බැගින් උපරිම ලකුණු 5 කි.

දිගුකාලීන තැන්පතු ගිණුම් සංඛ්‍යාවේ වර්ධනය <u>= (2017 සමුච්චිත **දිගුකාලීන** ගිණුම් සංඛ්‍යාව - 2016 සමුච්චිත **දිගුකාලීන** ගිණුම් සංඛ්‍යාව×100%)</u>
2016 සමුච්චිත **දිගුකාලීන** ගිණුම් සංඛ්‍යාව

**3.2. සාමාන්‍ය තැන්පතු ( සාමාජික නොවන, දිරියමාතා) - ලකුණු 32**

**3.2.1** සමුච්චිත තැන්පතු මුදල් **- ලකුණු 12**

මේ දක්වා රැස්කරගෙන ඇති සාමාන්‍ය තැන්පතු මුදල රු.මිලියන 02 ක් හෝ ඊට අඩු නම් ලකුණු 1කි.ඊට වැඩි වන සෑම රු.මිලියන 02 ට ලකුණු 01 බැගින් **උපරිම ලකුණු 12**

<u>මුළු සමුච්චිත සාමාන්‍ය තැන්පතු මුදල</u>
රු.මිලියන 02

**3.2.2** සාමාන්‍ය **තැන්පතු මුදලේ වර්ධනය - ලකුණු 12**

කාලය තුල සාමාන්‍ය තැන්පතු මුදලේ වර්ධන ප්‍රතිශතය 10% ක් හෝ ඊට අඩු නම් ලකුණු 3 කි .ඊට වැඩි වන සෑම 10%ට ලකුණු 3 බැගින් **උපරිම ලකුණු 12 කි**

කාලය තුළ සාමාන්‍ය තැන්පතු මුදලේ වර්ධනය } = <u>(2017 සමුච්චිත සාමාන්‍ය තැන්පතු මුදල - 2016 සමුච්චිත සාමාන්‍ය තැන්පතු මුදල) ×100%</u>
2016 සමුච්චිත සාමාන්‍ය තැන්පතු මුදල

**3.2.3 තැන්පත් ගිණුම් සංඛ්‍යාවේ වර්ධනය - ලකුණු 08**

කාලය තුල ගිණුම් සංඛ්‍යාවේ වර්ධන ප්‍රතිශතය 2.5% ක් හෝ ඊට අඩු නම් ලකුණු 2 කි. ඊට වැඩි වන සෑම 2.5%ට ලකුණු 2 බැගින් **උපරිම ලකුණු 08 කි**

සාමාන්‍ය ගිණුම් සංඛ්‍යාවේ වර්ධනය } = <u>(2017 සමුච්චිත සාමාන්‍ය ගිණුම් සංඛ්‍යාව -2016 සමුච්චිත සාමාන්‍ය ගිණුම් සංඛ්‍යාව) ×100%</u>
2016 සමුච්චිත සාමාන්‍ය ගිණුම් සංඛ්‍යාව

**3.3 සජීවීකරණ තැන්පතු (කණ්ඩායම්) - ලකුණු 30**

**3.3.1 සමුච්චිත කණ්ඩායම් තැන්පතු මුදල් - ලකුණු 15**

මේ දක්වා රැස්කරගෙන ඇති කණඩායම් තැන්පතු මුදල රු.මිලියන 2 ක් හෝ ඊට අඩු නම් ලකුණු 1කි.ඊට වැඩි වන සෑම රු.මිලියන 2 ලකුණු 01 බැගින් **උපරිම ලකුණු 15 කි.**

<u>මුළු සමුච්චිත **කණ්ඩායම්** තැන්පතු මුදල</u>
රුපියල් මිලියන 2

**3.3.2 කණ්ඩායම් තැන්පතු මුදලේ වර්ධනය - ලකුණු 10**

කාලය තුල කණ්ඩායම් තැන්පතු මුදලේ වර්ධන ප්‍රතිශතය 10% ක් හෝ ඊට අඩු නම් ලකුණු 4 කි. ඊට වැඩි වන සෑම 10% ට ලකුණු 4 බැගින් **උපරිම ලකුණු 10 කි**

කාලය තුළ තැන්පතු මුදලේ වර්ධනය } = <u>(2017 සමුච්චිත **කණ්ඩායම්** තැන්පතු මුදල - 2016 සමුච්චිත **කණ්ඩායම්** තැන්පතු මුදල)×100%</u>
2016 සමුච්චිත **කණ්ඩායම්** තැන්පතු මුදල

**3.3.3 කණ්ඩායම් තැන්පතු ගිණුම් සංඛ්‍යාවේ වර්ධනය - ලකුණු 5**

කාලය තුල කණ්ඩායම් ගිණුම් සංඛ්‍යාවේ වර්ධන ප්‍රතිශතය 2 % ක් හෝ ඊට අඩු නම් ලකුණු 2.5 කි. ඊට වැඩි වන සෑම 2 % ට ලකුණු 2.5 බැගින් **උපරිම ලකුණු 5 කි**

කණ්ඩායම් ගිණුම් සංඛ්‍යාවේ වර්ධනය } = <u>(2017සමුච්චිත කණ්ඩායම් ගිණුම් සංඛ්‍යාව-2016 සමුච්චිත කණ්ඩායම් ගිණුම් සංඛ්‍යාව)×100%</u>
2016 සමුච්චිත කණ්ඩායම් ගිණුම් සංඛ්‍යාව

**3.4** **කොටස් ප්‍රාග්ධනය - ලකුණු 35**

**3.4.1 සමුච්චිත කොටස් මුදල - ලකුණු 20**

මේ දක්වා රැස්කරගෙන ඇති කොටස් මුදල රු.මිලියන 2 ක් හෝ ඊට අඩු නම් ලකුණු 2 කි.ඊට වැඩි වන සෑම රු.මිලියන 2 ට ලකුණු 2 බැගින් **උපරිම ලකුණු 20**

<u>මුළු සමුච්චිත කොටස් මුදල</u>
රු.මිලියන 2

**3.4.2 කොටස් මුදලේ වර්ධනය ලකුණු - 10**

කාලය තුල කොටස් මුදලේ වර්ධන ප්‍රතිශතය 10%ක් හෝ ඊට අඩු නම් ලකුණු 4කි. ඊට වැඩි වන සෑම 10%ට ලකුණු 4 බැගින් **උපරිම ලකුණු 10 කි**

$$\text{කොටස් මුදලේ වර්ධනය} = \frac{(\text{2017 සමුච්චිත කොටස් තැන්පතු මුදල} - \text{2016 සමුච්චිත කොටස් තැන්පතු මුදල})}{\text{2016 සමුච්චිත කොටස් තැන්පතු මුදල}} \times 100\%$$

**3.4.3 කොටස් ගිණුම් සංඛ්‍යාවේ වර්ධනය ලකුණු - 05**

කාලය තුල කොටස් ගිණුම් සංඛ්‍යාවේ වර්ධන ප්‍රතිශතය 1 % ක් හෝ ඊට අඩු නම් ලකුණු 1 කි. ඊට වැඩි වන සෑම 1% ට ලකුණු 1 බැගින් **උපරිම ලකුණු 05 කි**

$$\text{කොටස් ගිණුම් සංඛ්‍යාවේ වර්ධනය} = \frac{(\text{2017 සමුච්චිත ගිණුම් සංඛ්‍යාව} - \text{2016 සමුච්චිත ගිණුම් සංඛ්‍යාව})}{\text{2016 සමුච්චිත ගිණුම් සංඛ්‍යාව}} \times 100\%$$

**3.5** **සාමාජික තැන්පතු - ලකුණු 08**

**3.5.1 සමුච්චිත සාමාජික තැන්පතු මුදල ලකුණු - 04**

මේ දක්වා රැස්කරගෙන ඇති සාමාජික තැන්පතු මුදල රු.මිලියන 6 ක් හෝ ඊට අඩු නම් ලකුණු 1කි.ඊට වැඩි වන සෑම රු.මිලියන 6 ට ලකුණු 01 බැගින් **උපරිම ලකුණු 04**

<u>මුළු සමුච්චිත සාමාජික තැන්පත් මුදල</u>
රු.මිලියන 06

**3.5.2 සමාජික තැන්පතු මුදලේ වර්ධනය ලකුණු - 02**

කාලය තුල සාමාජික තැන්පතු මුදලේ වර්ධන ප්‍රතිශතය 10% ක් හෝ ඊට අඩු නම් ලකුණු 1 කි. ඊට වැඩි වන සෑම 10% ට ලකුණු 1 බැගින් **උපරිම ලකුණු 02 කි**

$$\text{සාමාජික තැන්පතු මුදලේ වර්ධනය} = \frac{(\text{2017 සමුච්චිත සාමාජික තැන්පතු මුදල} - \text{2016 සමුච්චිත සාමාජික තැන්පතු මුදල})}{\text{2016 සමුච්චිත සමාජික තැන්පතු මුදල}} \times 100\%$$

**3.5.3 සාමාජික තැන්පතු ගිණුම් සංඛ්‍යාවේ වර්ධනය ලකුණු - 2**

කාලය තුල සාමාජික ගිණුම් සංඛ්‍යාවේ වර්ධන ප්‍රතිශතය 3.5% ක් හෝ ඊට අඩු නම් ලකුණු 1කි. ඊට වැඩි වන සෑම 3.5% ට ලකුණු 1 බැගින් **උපරිම ලකුණු 02 කි**

$$\text{ගිණුම් සංඛ්‍යාවේ වර්ධනය} = \frac{(\text{2017 සමුච්චිත සාමාජික ගිණුම් සංඛ්‍යාව} - \text{2016 සමුච්චිත සාමාජික ගිණුම් සංඛ්‍යාව})}{\text{2016 සමුච්චිත සාමාජික ගිණුම් සංඛ්‍යාව}} \times 100\%$$

## 4 ණය - මුළු ලකුණු 135

සමෘද්ධි ප්‍රජාමූල බැංකුවේ ප්‍රධාන අපේක්ෂාව වන්නේ අඩු ආදායම්ලාභි ව්‍යවසායක ප්‍රජාවට ප්‍රාග්ධන සම්පාදනයයි. ණය යනු බැංකුවේ ලාභ ඉපැයීමේ ප්‍රධාන වත්කම වේ. කල්පසුවූ ණය සහ බොල්ණය රහිත හොඳ ණය කළඹක් පවත්වා ගැනීම බැංකුවේ ප්‍රධාන වගකීම විය යුතු අතර, මෙම තත්වය මිනුම් කිරීම පහත දර්ශක මගින් අපේක්ෂා කෙරේ.

### 4.1 පිටහිටි ණය - ලකුණු 60

පිටහිටි ණය මුදල රු.මිලියන 10 ක් හෝ ඊට අඩු නම් ලකුණු 4.25 කි. වැඩිවන සෑම මිලියන 10ට ලකුණු 4.25 බැගින් **උපරිම ලකුණු 60 කි.**

$$\frac{\text{මුළු පිටහිටි ණය මුදල}\times 100\%}{\text{රු.මිලියන } 10}$$

**පිටහිටි ණය ප්‍රමාණය මිලියන 145 හෝ ඊට වැඩි නම් අතිරේක ලකුණු (Bonus) 01 ක් හිමිවේ.**

### 4.2 ණය මුදලේ වර්ධනය - ලකුණු 50

ණය මුදලේ වර්ධන ප්‍රතිශතය 10% ක් හෝ ඊට අඩු නම් ලකුණු 10 කි. වැඩිවන සෑම 10% ඒකකයකට ලකුණු 10 බැගින් **උපරිම ලකුණු 50කි.**

$$\text{ණය මුදලේ වර්ධනය} = \frac{(\text{2017 මුදාහල ණය සමුච්චිතය- 2016 මුදාහල ණය සමුච්චිතය})\times 100\%}{\text{2016 මුදාහල ණය සමුච්චිතය}}$$

### 4.3 ණය සංඛ්‍යාවේ වර්ධනය - ලකුණු 10

ණය සංඛ්‍යාවේ වර්ධන ප්‍රතිශතය සෑම 3.5% ක් හෝ ඊට අඩු නම් ලකුණු 2.5 කි .ඊට වැඩිවන සෑම 3.5% ඒකකයකට ලකුණු 2.5 බැගින් **උපරිම ලකුණු 10**කි.

$$\text{මුදාහල ණය සංඛ්‍යාවේ වර්ධනය} = \frac{(\text{2017 සමුච්චිත ණය සංඛ්‍යාව - 2016 සමුච්චිත ණය සංඛ්‍යාව})\times 100\%}{\text{2016 සමුච්චිත ණය සංඛ්‍යාව}}$$

### 4.4 ණය කරුවන් අනුපාතය - ලකුණු 15

බැංකු බල ප්‍රදේශයේ ණය ගලා යාමේ විභවතාව සලකා බලයි. සමෘද්ධි ප්‍රජාමූල බැංකුවේ අරමුණ අඩු ආදායම්ලාභින් වෙත අවශ්‍ය ප්‍රාග්ධන සම්පාදනය කර ඒ තුලින් ජීවනෝපාය සංවර්ධනයට දායක කරවීමයි

$$\text{ණයකරුවන්ගේ අනුපාතය} = \frac{\text{පිටහිටි ණය සංඛ්‍යාව}\times 100\%}{\text{කොටස් කරුවන් සංඛ්‍යාව}}$$

ඉහත සූත්‍රය අනුව 10% ඒකකයකට හෝ ඉන් කොටසකට ලකුණු 3 කි.ඊට වැඩිවන සෑම 10% කොටසකට ලකුණු 3 බැගින් **උපරිම ලකුණු 15කි.**

**5.** **<u>අවදානම් කලමනාකරණය - මුළු ලකුණු 125</u>**

මූල්‍ය ස්වයංපෝෂිතභාවය ඇති කිරීම සඳහා බැංකුව තුල ඒ ඒ විෂයට අදාලව අවදානම් කලමනාකරණය කර තිබීම අත්‍යාවශ්‍ය වේ.

සමෘද්ධි ප්‍රජාමූල බැංකු මුහුණ දෙන ප්‍රධාන අවදානම් ත්‍රිත්වය කලමනාකරණය කර තිබීම පිළිබඳ සලකා බලයි.

1. ණය අවදානම - 40
2. ද්‍රවශීලතා අවදානම - 15
3. මෙහෙයුම් අවදානම - 70

**5.1 ණය අවදානම් කලමනාකරණය- ලකුණු 40කි.**

බැංකුවේ ප්‍රධාන වත්කම වූ ණය වල අවධානම අවම කර ගෙන තිබීම මෙහිදි සලකා බලා ඇත.

**5.1.1 කල් පසු වූ ණය අනුපාතය :- ලකුණු 15 (**මාස 09 ට වඩා අඩු ප්‍රමාද ගෙවීම්)

පිටිහිටි ණය කළඹේ අවදානම මෙහිදී සලකා බලයි.සැබැවින්ම මෙම ඇගයීම සඳහා භාවිතා කරන්නේ අවදානම්ගත ණය කළඹ අනුපාතයයි.(PAR-Portfolio At Risk) ගණනය කිරීම සඳහා **කල්පසුවූ ණය මුදලේ මුළු පිටහිටි ණය ශේෂය** සලකා බලයි.

| | |
|---|---|
| කල්පසුවූ ණය ප්‍රතිශතය 0 නම් | ලකුණු 15කි |
| 0<කල්පසුවූ ණය ප්‍රතිශතය <u><</u>1% නම් | ලකුණු 12කි |
| 1<කල්පසුවූ ණය ප්‍රතිශතය ≤3% නම් | ලකුණු 10කි |
| 3<කල්පසුවූ ණය ප්‍රතිශතය <u><</u>5% නම් | ලකුණු 05 කි |
| 5<කල්පසුවූ ණය ප්‍රතිශතය <u><</u>10 % නම් | ලකුණු 00කි |

කල්පසුවූ ණය ප්‍රතිශතය 10% ට වඩා වැඩි වන සෑම ඒකකයක් සඳහාම -1බැගින් **උපරිම-5 කි. (සෘණ ලකුණු)**

කල්පසුවූ ණය අනුපාතය = <u>කල්පසුවූ ණය වාරික සහිත ඊට අදාල මුළු පිටහිටි ණය මුදල් එකතුව</u>X100%
මුළු පිටහිටි ණය මුදල

කල් පසු වූ ණය නොමැති බැංකු සඳහා සම්පූර්ණ ලකුණු 15 ලබා දේ.

**5.1.2 බොල් ණය අනුපාතය - ලකුණු 10**

මාස 9 ට වඩා වැඩි වාරික ගෙවීම් පැහැර හැර ඇති ණය වල පිටහිටි ණය මුදල් මේ යටතේ සලකා බලයි. බොල් ණය වැඩිවීම යනු බැංකුවේ වියදම් වැඩි වීමට බලපාන අතර ලාභය අඩු වී තිරසාර බවේ අවධානමකට මුහුණපානු ඇත.**(බොල් ණය ගණනයේ දී ලැබිය යුතු බොල් ණය- රටවිරු නිවාස - ඇතුලත් නොකරන මෙන් උපදෙස් ලබා දෙනු ලැබේ.**)

- බොල් ණය ප්‍රතිශතය 0 නම් — ලකුණු 10 කි
- 0<බොල් ණය ප්‍රතිශතය <u><</u> 0.5% නම් — ලකුණු 08 කි
- 0.5<බොල් ණය ප්‍රතිශතය <u><</u>1.5% නම් — ලකුණු 06කි
- 1.5<බොල් ණය ප්‍රතිශතය <u><</u> 3% ත් නම් — ලකුණු 04කි
- 3<බොල් ණය ප්‍රතිශතය <u><</u> 5% ත් නම් — ලකුණු 0 කි
- බොල් ණය ප්‍රතිශතය 5% වඩා වැඩි වන සෑම 5% සඳහාම (-2) බැගින් උපරිම**(-10)කි. (සෘණ ලකුණු)**
- බොල් ණය අනුපාතය = <u>බොල් ණය ශේෂය</u> X 100%
  මුළු පිටහිටි ණය මුදල

### **5.1.3** බොල් ණය ආපසු අය කර ගැනීම - ලකුණු 15

මුළු බොල් ණය ප්‍රමාණයෙන් අය කර ගන්නා සෑම 10% ක් සඳහාම ලකුණු 2.5 බැගින් උපරිම ලකුණු 15 කි

වර්ෂය තුල අය කර ගත් බොල් ණය ප්‍රමාණය X 100%

(2016.12.31 ට පැවති සමුච්චිත බොල් ණය ශේෂය+2017 වෙන්කරන ලද බොල්ණය ප්‍රමාණය)

බොල් ණය අනුපාතය "0" වූ බැංකු සඳහා මෙම උපරිම ලකුණු 15 හිමිවේ.

**5.1.4 සම්බන්ධිත පාර්ශව වෙත ණය ලබා දීම පාලනය කිරීම**

සලකා බලන කාලය තුල සේවක අක්‍රමිකතා බොල් ණය ගිණුමෙහි ශේෂය රු.50000/-ක් නම් -1 ක් එකතු වේ.ශේෂය වැඩි වන සෑම රු.50,000/- කටම -1 බැගින් මුළු ලකුණු ප්‍රමාණයට එකතු වේ. **(ඍන ලකුණු)**

### **5.1.5** බොල් ණය සඳහා වෙන් නොකිරීම

කිසියම් බැංකුවක් චක්‍ර ලේඛ උපදෙස් අනුව 100% ක් බොල් ණය සංචිත වෙන් කර නැත්නම් ලබා ගන්නා ලද ලකුණු වලට -2 ක් එකතු වේ. **(ඍණ ලකුණු)**

### **5.2** ද්‍රවශීලතා අවදානම් කළමනාකරණය - ලකුණු 15

**5.2.1 ද්‍රවශීලතා අනුපාතය :- ලකුණු 5කි**

1≤අනුපාතය ≤10 වේ නම් ලකුණු 05ක්ලබාදේ.

ද්‍රවශීලතා අනුපාතය = (ඉතිරි කිරිමේ ගිණුම් ශේෂය+අත ඉතිරි මුදල් ගිණුම් ශේෂය+ජංගම ගිණුම් ශේෂය )X 100%

මුළු තැන්පතු

චක්‍රලේඛ උපදෙස් අනුව මෙම අනුපාතය 10% ක් විය යුතු අතර,ඊට වඩා වැඩි වන සෑම 1% ක් සඳහාම -1 බැගින් (ඍණ ලකුණු) එකතු වේ. විශේෂයෙන් මෙහිදී අරමුදල් කළමනාකරණය පිළිබඳව හැකියාව සලකා බලයි. (FUND MANEGEMENT)

**5.2.2 ණය තැන්පතු අනුපාතය :- ලකුණු 10 කි.**

ණය තැන්පතු අනුපාතය = මුළු පිටහිටි ණය ශේෂය ×100%

මුළු තැන්පතු

- මුළු තැන්පතු = කොටස්+සාමාජික+සාමාජික නොවන+ළමා+දිරියමාතා+සමූහ+සිසුරක+අනිවාර්ය ඉතුරුම්
- පිටහිටි ණය = පාරිභෝගික+ජීවනෝපාය චක්‍රීය ණය+ප්‍රතිමූල්‍ය ණය මත ලබා දුන් ණයද ඇතුලත් පිටහිටි ණය ශේෂය
- ණය තැන්පතු අනුපාතය, **උපරිම ලකුණු 10කි.**

  50≤අනුපාතට < 70 නම් ලකුණු 05

  70≤අනුපාතට < 80 නම් ලකුණු 08

  80≤අනුපාතට ≤ 110 නම් ලකුණු 10

- එසේ නොමැති නම් ලකුණු නොමැත.ලකුණු 0 කි.
- සමෘද්ධි බැංකුවේ පවතින සුවිශේෂී තත්වයන් සළකා මෙම අනුපාතයේ අගය 110 දක්වා වැඩි කර ඇත.

**5.3** **මෙහෙයුම් අවදානම් කළමනාකරණය :- ලකුණු 70කි**

බැංකු මෙහෙයුම් ක්‍රියාවලියේදී අවදානම කලමණාකරණය කර තිබීම මෙහිදී සලකා බලයි. එනම් මෙහෙයුම් ක්‍රියාවලියේදී චක්‍රලේඛ හා මෙහෙයුම් උපදෙස් සම්බන්ධව බැංකුව දක්වන අනුකූලතාවය (COMPLENCE) ඇතුළු බැංකුවේ සමස්ථ මෙහෙයුම් අවධානම කළමණාකරණය කර තිබීම මෙහිදී මනිනු ලැබේ. එය පහත සදහන් කරුණු ඔස්සේ සලකා බලනු ලබයි.

**5.3.1** **මෙහෙයුම් කාර්යක්ෂමතාවය : ලකුණු 30**

පහත සඳහන් කරුණු ඔස්සේ බැංකුවේ මෙහෙයුම් අවදානම කළමනාකරණය කර තිබීම සලකා බලයි.

- 2017.12.31 දින වන විට ලැබී ඇති විගණන විමසුම් සඳහා දින 14 ක් ඇතුලත පිළිතුරු සැපයීමට කටයුතු කර තිබීම. - ලකුණු 05
- බැංකුව තුල සියළුම මාසික ශේෂ පිරික්ෂුම් තුලනය වී ඇත.ලකුණු 05කි.
  50% හෝ ඊට වැඩි ප්‍රතිශතයක් ශේෂ පිරික්සුම් තුලනය වී නොමැති නම් -5 (ඍණ ලකුණු) ක් ලබා දේ .ඊට අඩු ප්‍රතිශතයක් නම් ලකුණු 0කි.
- පොදු ලෙජරය යාවත්කාලීනව පවත්වාගෙන යන්නේ නම් උපරිම ලකුණු 5ක් එකතු වේ.නැත්නම් -1 (ඍණ ලකුණු) මුළු ලකුණු වලට එකතු වේ.
- වසර තුල බැංකුවේ කීර්තිනාමයට ඉවහල් වන සමාජ සත්කාර/නිර්මාණාත්මක වැඩ සටහන් සඳහා

**- ලකුණු 15 (**සාධක සහිතව තහවුරු කර ගත යුතුය, ප්‍රාදේශීය /දිස්ත්‍රික්/ජාතික මට්ටමට දැනුවත් විය යුතුය, භෞතිකව පැවතිය යුතුය).

- අවිනිශ්චිත ගිණුමෙහි ශේෂයක් පැවතීම ලකුණු -5 ක් හිමි වේ.නැත්නම් ලකුණු නැත.

**5.3.2** **ලිපි ගොණුකරණය ( කාර්යාල කළමනාකරණය ) ලකුණු 25**

පහත සඳහන් කරුණු සම්පූර්ණ කර ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබා දේ.

i යාවත්කාලීන විෂය ගොනු ලේඛන නඩත්තු කිරීම (ලිපි ලැබීම් යැවීම් රෙජිස්තර,පැමිණිමේ ලේඛන,නිවාඩු ලේඛන, බැහැර ලේඛන, කෙටි නිවාඩු ලේඛන, ලොග් සටහන් පොත ඇතුළු සියළු අභ්‍යන්තර පරිපාලන ලේඛන,යාවත්කාලීන ලෙජර් නඩත්තුව
ii ගොනු හා ලේඛනවල කවරයේ පැහැදිලිව නාමය හා ගොනු අංකය යොදා තිබීම
iii ගොනුවේ ලිපි අංකනය කර තිබීම හා ගොනුවේ ලිපි ක්‍රමානුකූලව අසුරා ගැට ගසා තිබීම
iv අධීක්ෂණ නිලධාරියාට යොමු කරන ලිපි සඳහා වාර්තා සටහන් තබා තිබිම
එක් කරුණක් සම්පූර්ණ විමට ලකුණු 2.5 බැගින් **- උපරිම ලකුණු 10 කි.**

- චක්‍රලේඛ මෙහෙයුම් උපදෙස් හා අභ්‍යන්තර මග පෙන්වීම් ගොනු පිළිවෙලට සකස් කර ගොනු ගත කිරීම **- ලකුණු 05**
- නිසිපිළිවෙලට ලිපිගොනු අසුරා තැබීම හා භාවිතයට පහසුවෙන් ගත හැකිවීම. **- ලකුණු 05**
- සේප්පු යතුරු පරිහරණය චක්‍රලේඛ උපදෙස් පරිදි සිදු කිරීම **- ලකුණු 05**

**5.3.3** **තොරතුරු කළමනාකරණය - ලකුණු 15**

I. අංක 2017/13 අවසාන ගිණුම් පියවීම හා මූලා ප්‍රකාශන පිළියෙල කිරීම චක්‍රලේඛනය අනුව 2017.12.31 දිනට එවිය යුතු වූ සියළුම බැංකු ප්‍රගති වාර්තා නියමිත දිනයන්ට නිවැරදිව අදාල ප්‍රජා මූල බැංකු සමිතිය වෙත එවීම, හා ප්‍රගති වාර්තා ගොනු පවත්වා ගෙන යාම - **ලකුණු 05**

**II.** 2018 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර තිබීම.(ඉදිරි සැලස්මක් සහිත ලිපි ගොණුවක් පවත්වාගෙන යාම හා ඒ අනුව ක්‍රියාකර තිබීම.) **- ලකුණු 05**

**III.** ක්‍රමවත්ව පසු විපරම් හා ප්‍රගති සමාලෝචන ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම. (වාර්තා සටහන් හා සහභාගි ලේඛණ සලකා බැලිය යුතුය.) **- ලකුණු 05**

## 6. ලාභදායිත්වය - මුළු ලකුණු 80

ආයතනයක් ලාභදායිවන්නේ මෙහෙයුම් ආදායම මෙහෙයුම් වියදමට වඩා වැඩිවන විටය.

**6.1 කාලය තුල උපයාගත් ලාභය (2017 වර්ෂය) - ලකුණු 35**

වර්ෂයේ ලාභය සෑම මිලියන 1ටම ලකුණු 03 බැගින් උපරිම ලකුණු 35කී.

$$\frac{\text{ශුද්ධ ලාභය}}{\text{රුපියල් මිලියන 1}}$$

**ලාභදායිත්වය රු මිලියන 13-15 අතර නම් අතිරේක ලකුණු** (Bonus) **1 ක් හිමි වන අතර රු මිලියන 15 ට වැඩි වන විට අතිරේක ලකුණු** (Bonus) **2ක් හිමිවේ**

**6.2 .ආදායම තුල ණය පොලී ආදායම - ලකුණු 20**

ණය පොලී ආදායමේ අනුපාතය සෑම 10% සඳහාම ලකුණු 4 බැගින් උපරිම ලකුණු 20 කී.

$$\text{අදායම තුල ණය පොලී ආදායම} = \frac{\text{ණය පොලී ආදායම} \times 100\%}{\text{මුළු ආදායම}}$$

**6.3 වත්කම් මත ගලපන ලද ප්‍රතිලාභ අනුපාතය (AROA) - ලකුණු 10**

$$\text{වත්කම් මත ගලපන ලද ප්‍රතිලාභ අනුපාතය (AROA)} = \frac{\text{ශුද්ධ ලාභය} \times 100}{\text{මුළු වත්කම්}}$$

වත්කම් මත ගලපන ලද ප්‍රතිලාභ අනුපාතය $\leq$ 1 වේ. නම් ලකුණු 3 කි. 1% ට වඩා වැඩි වන සෑම 0.5 ඒකකයකටම ලකුණු 2.5 බැගින් **උපරිම ලකුණු 10කී.**

**6.4 කොටසක ඉපයීම්** - ලකුණු 05

$$\text{කොටසක ඉපයීම්} = \frac{\text{ශුද්ධ ලාභය}}{\text{මුළු කොටස් කරුවන් සංඛ්‍යාව}}$$

කොටසක ඉපයීම$\leq$1000 නම් ලකුණු 2කි.1000 ට වඩා වැඩිවන සෑම රු. 200/- ඒකකයකටම ලකුණු 1බැගින් **උපරිම ලකුණු 5 කී.**

**6.5 බැංකුවේ මූල්‍ය තිරසාර බව - ලකුණු 05**

$$\text{බැංකුවේ මූල්‍ය තිරසාර බව} = \frac{\text{ශුද්ධ මූල්‍ය වත්කම් (මුළු වත්කම්-බාහිර වගකීම්)} \times 100\%}{\text{බාහිර වගකීම්(මුළු තැන්පත්+ප්‍රතිමූල්‍ය ණය+ගෙවියුතු දෑ)}}$$

මුළු තැන්පත් ගණනයේදී කොටස් තැන්පත් හැර ගණනය කළ යුතුය.

මෙම අනුපාතයේ පිලිතුරේ අගය 10% ක් හෝ ඊට අඩු කොටසකට ලකුණු 2.5 කි. ඊට වැඩි වන සෑම 10% ඒකකයකටම ලකුණු 2.5 බැගින් උපරිම ලකුණු 05කි.

**6.6 මුළු ආදායමින් කාර්ය මණ්ඩල වියදම් අනුපාතය - ලකුණු 05**

අනුපාතය $\geq$ 30 නම් ලකුණු 02කි.
30 > අනුපාතය $\geq$25 නම් ලකුණු 03කි.
25> අනුපාතය $\geq$ 20 නම් ලකුණු 04කි.
අනුපාතය <20 නම් ලකුණු 05කි.

$$\text{මුළු ආදායමින් කාර්ය මණ්ඩල වියදම් අනුපාතය} = \frac{\text{කාර්ය මණ්ඩල වියදම} \times 100\%}{\text{වර්ෂය තුල මුළු ආදායම}}$$

**කාර්ය මණ්ඩල වියදම=(**පොදු ලෙජරයේ කේත අංක 2112,2113,2131හා2132 යන පාලන ගිණුම්හි ශේෂවල එකතුව)

**7 බැංකු පරිශ්‍රය - මුළු ලකුණු 35**

- චක්‍රලේඛ උපදෙස් පරිදි සකස් කල නාම පුවරු ප්‍රදර්ශනය - ලකුණු 05
- චක්‍රලේඛ උපෙදස් පරිදි තීන්ත ආලේපනය - ලකුණු 05
- බැංකු ගොඩනැගිලි නඩත්තුව හා ආරක්ෂණ විධි විධාන (තාප්පය/වැට , ස්ථිර අවධානම් රහිත ගොඩනැගිල්ලක් විම) - ලකුණු 05
- ගෙවත්ත පිරිසිදුව තබා ගැනීම හා ගෙවතු අලංකරණය - ලකුණු 05
- ගණුදෙනුකරුවන් හා ප්‍රජා නායකයින් සුහද ශිලිව පිළිගැනීම සඳහා ගෙන ඇති පියවර (ආසන පහසුකම්, බීම සඳහා ජලය, වැසිකිළි පහසුකම්, පුවත්පත්, රූපවාහිනි) එක කරුණකට ලකුණු 2.5 බැගින් උපරිම - **ලකුණු 10**
- චක්‍රලේඛ ප්‍රකාරව අනවශ්‍ය දෑ ඉවත් නොකිරීම -1 (ඍණ ලකුණු)
- මූලික තොරතුරු ප්‍රදර්ශනය (ගනුදෙනුකරුවන් දැනුවත් විය යුතු මූලික දත්ත ප්‍රදර්ශනය - තැන්පතු වර්ග, ණය වර්ග, පොලී අනුපාත, ණය සීමා, ප්‍රධාන කාර්යාලීය ක්ෂණික ඇමතුම් දුරකථන අංකය) කරුණකට ලකුණු 1 බැගින් උපරිම - ලකුණු 05

**8. ආකෘති සම්පූර්ණ කිරීම (ප්‍රාදේශීය මට්ටම/ බැංකු සමිති මට්ටම) :-**

හඳුන්වා දී ඇති ආකෘතියට තොරතුරු ඇතුලත් කිරීම අදාල බැංකු කලමනාකරු විසින් සිදුකල යුතුය. ඇමුණුම අංක 1 මගින් අදාල ආකෘතිය දක්වා ඇත. අදාල බැංකුවට තොරතුරු ඇතුලත් කිරිමේදි බැංකුව අයත් ප්‍රජා මුල බැංකු සමිති කළමනාකරු විසින් එහි අධීක්ෂණය සිදු කල යුතුය.

නිවැරදි ආකාරයට තොරතුරු ඇතුලත් නොවූ ආකෘති පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. ආකෘති පත්‍ර සම්පූර්ණ කිරිමේදි ප්‍රජාමූල බැංකු සමිති කළමනාකරු විසින් පහත සඳහන් පියවරන් අනුගමනය කල යුතුය.

I. අදාළ ආකෘති පත්‍රය බාගත කර ගැනීම (Download)
II. බැංකු සමිතියට අයත් බැංකු ප්‍රමාණයට සමාන ආකෘති පත්‍ර කට්ටලය බැගින් බැංකු සමිති කළමනාකරු විසින් ලබා ගැනීම
III. නියම කරන දිනයකදී සමෘද්ධි ප්‍රජාමුල බැංකු සමිති කළමනාකරු විසින් තම අධීක්ෂණය යටතේ ඒ ඒ බැංකු කළමනාකරු මගින් තම බැංකුවට අදාල ආකෘති පත්‍රය සම්පූර්ණ කර ලබා ගැනීම. (අනු අංක 3,4, 5.1, 5.2 , 6 ට අදාල උප අංකද ඇතුලත් නිර්නායක)
IV. අනු අංක 5.3 හා 7 ට අදාල උප අංකද ඇතුලත් වන පරිදි ලකුණු ලබා දීම කමිටුවක් මගින් සිදු කළ යුතුය.
V. ප්‍රජාමූල බැංකු සමිති කළමනාකරු විසින් තම ප්‍රජාමූල බැංකු සමිති බල ප්‍රදේශයට අයත් සියළුම බැංකු වල තොරතුරු ආකෘතියට ඇතුළත් කිරිමෙන් පසු එම ආකෘති පත්‍ර නිසි පරිදි ප්‍රාදේශීය ලේකම්වරයා මගින් දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කිරීම

<u>8.1 බාහිර නිරික්ෂණ මත ලකුණු දීම</u>

අදාල ආකෘතියට තොරතුරු ඇතුලත් කිරීමේදී අනු අංක 5.3 හා 7 ට අදාල අනු අංකද ඇතුලත්ව ලකුණු ලබාදීමේදී ලේඛණ ගත තොරතුරුවලට අමතරව, බාහිර නිරික්ෂණ මත පිහිටා ලකුණු ලබාදීමට සිදුවනු ඇත. තෝරාගන්නා ලද ස්වාධීන කමිටුවක් මගින් අදාල ඇගයීම් සිදුකල යුතු අතර තම දිස්ත්‍රික්කයේ බැංකු ඇගයීමේදී බාහිර නිරීක්ෂණ මත ලකුණු ලබා දීම ප්‍රාදේශිය ලේකම් අධීක්ෂණය යටතේ වූ කමිටුවක් මගින් සිදුවිය යුතුය දිස්ත්‍රික් නියෝජනයක්ද සහිතව 5 දෙනකුගෙන් යුත් කමිටුවක් ප්‍රාදේශිය ලේකම් යටතේ සකස් කලයුතු අතර සංයුතිය පහත පරිදි වේ.

I  ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මාණ්ඩලික නිළධාරීවරයෙකු (සභාපති)
ii  ප්‍රජාමූල බැංකු සමිති කළමණාකරු  (ලේකම්)
iii  දිස්ත්‍රික් කාර්යාලීය  කළමණාකරුවෙකු
iv  මූලස්ථාන කළමණාකරු
v  ව්‍යාපෘති නළමණාකරු

දිස්ත්‍රික්කයට අදාලව නිලධාරින් නම් කිරිම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ විසින් ද ප්‍රාදේශීය මට්ටමට අදාලව නිලධාරින් නම් කිරිම ප්‍රාදේශිය ලේකම් විසින් ද  සිදු කල යුතු අතර එම නම් කිරිම් සියල්ල දිස්ත්‍රික් සමෘද්ධි  අධ්‍යක්ෂ  වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත යුතුය. (ඇමුණුම 02)  ඒ අනුව අදාල රාජකාරි කොටස් පැවරෙනු ඇත.

**8.2 තොරතුරු නිවැරදි බවට සහතික කිරිම හා ප්‍රතිඵල ලේඛන ඉදිරිපත් කිරිම**

බැංකු කළමණාකරු විසින් තම  බැංකුවට අදාල ලේඛනගත තොරතුරු ආකෘතියට ඇතුලත් කිරීමෙන් පසුව,අදාල **ප්‍රජාමූල බැංකු සමිති කළමණාකරු** විසින් එම තොරතුරුවල සත්‍යතාව පරික්ෂා කර තොරතුරු නිවැරදි බවට අත්සන් තැබිය යුතුය. අනතුරුව බාහිර නිරීක්ෂණ මත ලබා දුන් ලකුණු ඇතුලත් ආකෘතීන්ද සමඟ  සියළු ලකුණු සටහන්පත් **ප්‍රාදේශීය ලේකම් නිර්දේශ** කර එකම කවරයක බහා දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ වෙත භාර දිය යුතුය.

**8.3 දිස්ත්‍රික් මට්ටම**

දිස්ත්‍රික් මට්ටමේ ලකුණු ඇතුළත් කිරීමේ දිස්ත්‍රික් ඇගයීම් ආකෘති පත්‍රය ක්ෂුද්‍ර මූල්‍ය අංශයේ තොරතුරු කලමනාකරණ ඒකකයේ misbank2015@yahoo.com යන ලිපිනයේ සහ samu123123 යන රහස්‍ය අංකය භාවිතා කරමින් බාගත (Download) කර ගත හැකිය.ඒ ඒ බැංකුවට අදාල තොරතුරු ඇතුලත් කිරීමේදී  දිස්ත්‍රික් මාසික බැංකු ප්‍රගති වාර්තා එවනු ලබන බැංකු අනුපිළිවෙලට බැංකුවල නම් ඇතුලත් කිරීමෙන් එම කටයුතු පහසුවන අතර තොරතුරු විශ්ලේෂණය පහසු කරයි. නිවැරදි ආකාරයට තොරතුරු ඇතුළත් නොවූ, අසම්පූර්ණ හා නොගැලපෙන ඇගයීම් ආකෘති පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

දිස්ත්‍රික් ඇගයීම් ආකෘති පත්‍රයට තොරතුරු ඇතුළත් කිරීමෙන් පසුව දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්/දිස්ත්‍රික් ලේකම් උපදෙස්  පරිදි  දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂකගේ පූර්ණ අධීක්ෂණය යටතේ තිදෙනෙකුගෙන් සමන්විත කමිටුවක් මගින්  ප්‍රාදේශීය මට්ටමට හා දිස්ත්‍රික් මට්ටමට ප්‍රතිඵල ලේඛන වෙන වෙනම සකස් කල යුතුය. අනතුරුව දිස්ත්‍රික් මට්ටමින් බැංකු ඇගයීම් හා ශ්‍රේණිගත කිරීමේ ප්‍රතිඵල ලේඛනය සකස් කර ජාතික මට්ටමේ ඇගයීම් සඳහා දිස්ත්‍රික් ප්‍රතිඵල ලේඛන සමග සියළු ඇගයීම් ආකෘති පත්‍ර  දිස්ත්‍රික් ලේකම්/දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ අනුමැතියෙන් ප්‍රධාන කාර්යාලයේ ක්ෂුද්‍ර මූල්‍ය අංශයේ තොරතුරු කළමණාකරණ ඒකකය වෙත ගෙනැවිත් භාරදිය යුතුය. (අදාල විස්තර Pen Drive මඟින් ද ලබාදීමට කටයුතු කරන්න.)

සෑම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂකවරයෙකු විසින් ඉහලම ලකුණු ලබා ගන්නා බැංකු 10 අධීක්ෂණයට ලක් කළ යුතුය. මෙම බැංකු 10 ම A ශ්‍රේණියට අයත් වන්නේ නම් එවැනි විටෙක දිස්ත්‍රික්කයේ සියළු A ශ්‍රේණියට අයත් බැංකු  දිස්ත්‍රික් අධ්‍යක්ෂකගේ අධීක්ෂණයට ලක් කර ලබා ගත් ලකුණු තහවුරු කළ යුතුය.කෙසේ වෙතත් ඔබට හැඟියන්නේ නම් වෙනත් ඕනෑම බැංකුවක ලකුණු ලබා දීම පිළිබඳව පරීක්ෂා කිරීමට හැකියාව ඇති බව සඳහන් කරමි.

8.4 මෙම  චක්‍රලේඛනයේ 1.1 (iii) කරුණට  අදාල වන බැංකු දිස්ත්‍රික්කයේ D ශ්‍රේණිය  යටතේ ඇතුලත් කළ යුතුය.

**9. ලකුණු මත පදනම්ව බැංකු ශ්‍රේණිගත කිරීම හා ඇගයීම.**

මෙම ශ්‍රේණිගත කිරීම කාණ්ඩ 4 ක් යටතේ සිදුකරනු ලබන අතර එය පහත පරිදි වේ.

**9.1 ලකුණු දීමේ ක්‍රියාපටිපාටිය අනුව බැංකු ශ්‍රේණිගත කිරීම,**

| | | | | |
|---|---|---|---|---|
| මුළු ලකුණු 375 හෝ ඊට වැඩි | - | විශිෂ්ය | - | A ශ්‍රේණිය |
| 325≤මුළු ලකුණු < 375 | - | සතුටුදායක | - | B ශ්‍රේණිය |
| 250≤මුළු ලකුණු < 325 | - | සාමාන්‍ය | - | C ශ්‍රේණිය |
| මුළු ලකුනු 250 ට අඩු | - | විශේෂ අවධානය යොමු කල යුතු | - | D ශ්‍රේණිය |

සමස්ථ බැංකු පද්ධතිය තුල ඉහත ආකාරයට ලකුණු ලබාගනු ලබන ඕනෑම බැංකුවක් පොදුවේ ඒ ඒ ශ්‍රේණියට අයත් වන අතර, මින් ඉදිරියට සෑම වසරකම සලකා බලනු ලබන නිර්ණායක මත පදනම්ව ශ්‍රේණි ගත කිරීම සිදුවේ. (කාලීනව නිර්ණායක සංශෝධනය විය යුතුය) එහි දී සලකා බලන කාලය තුල අදාල නිර්ණායක මත ලබා ගනු ලබන ලකුණු අනුව යම් බැංකුවක් ඊට පහල ශ්‍රේණියකට පත් විය හැකිය. එබැවින් නිරන්තර ඉහල ශ්‍රේණියකට යාමට බැංකු කලමණාකාරිත්වය කටයුතු කල යුතුය

**10 ඇගයීම් ක්‍රියාවලිය**

අවස්ථා 02ක් යටතේ ඇගයීම් ක්‍රියාවලිය සිදුවේ

- බැංකු ඇගයීම ( බැංකු මට්ටමින්)
- කාර්ය මණ්ඩල ඇගයීම (බැංකු කාර්යයන්ට ලබාදුන් දායකත්වය මත)

**10.1 බැංකු ඇගයීම**

බැංකු ශ්‍රේණිගත කිරීමට සමගාමීව ප්‍රාදේශීය, දිස්ත්‍රික් හා ජාතික මට්ටමින් එම බැංකු ඇගයීම් ක්‍රියාවලියක්ද ක්‍රියාත්මක කෙරේ.

**10.1.1 ප්‍රාදේශීය මට්ටම :-**

ඉහත නිර්නායක මතම පිහිටා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වැඩිම ලකුණු ලබාගන්නා බැංකු 3 ක් පිළිවෙලින් තෝරාගෙන ඇගයීමට ලක් කෙරේ. එහිදි අවම ලකුණු මට්ටම 250 ක් හෝ ඊට වැඩි විය යුතුය.

ඇමුණුම අංක 01 ආකෘතිය

**10.1.2 දිස්ත්‍රික් මට්ටම :-**

ඉහත නිර්නායක මතම පිහිටා දිස්ත්‍රික්කයේ වැඩිම ලකුණු ලබාගන්නා බැංකු 3 ක් පිළිවෙලින් තෝරාගෙන ඇගයීමට ලක් කෙරේ. සාපේක්ෂ වශයෙන් බැංකු සංඛ්‍යාව වැඩි දිස්ත්‍රික්ක සඳහා ඇගයීමට ලක් කෙරෙන බැංකු තෝරා ගැනීමේදී ඊට අදාල සාධාරණයන් ඉටු කරනු ඇත. එනම් සාපේක්ෂ වශයෙන් වැඩි බැංකු ප්‍රමාණයක් ඇගයීම් සඳහා තෝරා ගැනේ. එහිදි අවම ලකුණු මට්ටම 325 ක් හෝ ඊට වැඩි විය යුතුය.දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්/දිස්ත්‍රික් ලේකම් පූර්ණ අධීක්ෂණය යටතේ දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ ප්‍රධානත්වයෙන් දිස්ත්‍රික් මට්ටමේ ඇගයීම් සිදුවිය යුතුය.

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| දිස්ත්‍රික් බැංකු | 60 හෝ 60 ට වඩා අඩු | | | | - | ස්ථාන 3 (1,2,3) |
| දිස්ත්‍රික් බැංකු | 61 | > | 90 | අතර | - | ස්ථාන 5 (1,2.3,4,5) |
| දිස්ත්‍රික් බැංකු | 91 | > | 120 | අතර | - | ස්ථාන 6 (1,2,3,4,5,6) |

**10.1.3 දිස්ත්‍රික් මට්ටම - වැඩිම A ශ්‍රේණි ප්‍රමාණයක් ලබා ගත් (% ගණන මත) සමෘද්ධි බැංකු සමිතිය තෝරා ගැනිම**

10.1.4 **ජාතික මට්ටම**

අධ්‍යක්ෂ ජනරාල්ගේ පූර්ණ අධීක්ෂණය යටතේ පත් කරණු ලබන ජාතික ඇගයීම් කමිටුවක ප්‍රධානත්වයෙන් ඇගයීම් කටයුතු සිදුකරනු ලබන අතර ජාතික මට්ටමට ඉදිරිපත් වූ බැංකු අතරින් ඉහලම ලකුණු ලබා ගන්නා බැංකු 10 ශ්‍රේණිගත කිරීම් වල අංක 1 සිට 10 දක්වා ශ්‍රේණිගත කර ජාතික මට්ටමේ දී ඇගයීමට ලක් කරනු ඇත. එසේ ඇගයීමේදී ජාතික මට්ටමේ ක්ෂේත්‍ර නිරීක්ෂණයන්ද සිදු කරනු ඇත.ඊට අතිරේකව ලකුණු 375 ට වැඩිව ලබා ගන්නා ඊළඟ සියළු බැංකු කුසලතා සම්මාන සඳහා තෝරා ගැනේ.

**10.1.5 අධි ශ්‍රේණියේ බැංකු ඇගයීම**

**බැංකු ඇගයීමේ නිර්ණායක අනුව කිසියම් සමෘද්ධි බැංකුවක් විසින් ලබාගන්නා මුළු ලකුණු ප්‍රමාණය ලකුණු 425 ට වැඩි වන අවස්ථාවලදී එය අධි ශ්‍රේණිගත බැංකු ලෙස විශේෂ ඇගයීමකට ලක් කෙරෙණු ඇත.**

**10.1.6 ඉහලම ලාභය ඉපයූ බැංකුව ඇගයීම**

ජාතික මට්ටමේ ලාභයට වැඩිම දායකත්වයක් සැපයූ බංකුව තෝරා ජාතික මට්ටමේ අගයනු ඇත.මෙහිදී ආදායම තුල ණය පොලී ආදායම 50% හෝ ඊට වැඩිවිය යුතුය.

**10.1.7 වැඩිම A ශ්‍රේණි ප්‍රමාණයක් ලබා ගත් දිස්ත්‍රික්කය ඇගයීම (% ගණන මත)**

**10.1.8 වැඩිම A ශ්‍රේණි ප්‍රමාණයක් ලබා ගත් ප්‍රජාමූල බැංකු සමිතිය ඇගයීම (% ගණන මත)**

**10.2.කාර්ය මණ්ඩල ඇගයීම**

බැංකු ශ්‍රේණිගත කිරීමේ ක්‍රියාවලියේදී A ශ්‍රේණියට තෝරාගනු ලබන බැංකුවලට හා ඇගයීම් ක්‍රියාවලියේදී විශිෂ්ඨත්වයට පත්වන බැංකු සඳහා හා එම බැංකුවල සියළු නිලධාරින් ඇගයීමට ලක් කෙරෙන අතර එම නිලධාරින් සඳහා තිළිණ හා සහතික පත්‍ර ප්‍රදානය කෙරෙනු ඇත.

**10.2.1 සමස්ථ ඇගයීම (ප්‍රාදේශීය මට්ටම)**

ප්‍රාදේශීය මට්ටමේදී **තේරී පත්වන** බැංකුවල කළමණාකරු, බැංකු කාර්ය මණ්ඩලය ,ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය හා පාලක මංඩලය ඇගයීමට ලක් කෙරේ.

**10.2.2 සමස්ථ ඇගයීම දිස්ත්‍රික් මට්ටම**

දිස්ත්‍රික් මට්ටමට **තේරී පත්වන** බැංකුවල කළමණාකරු,බැංකු කාර්යමණ්ඩලය, ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය, පාලක මංඩලය,බැංකු සමිති කළමණාකරු, විධායක කමිටුව හා ප්‍රාදේශිය ලේකම් ද ඇගයීමට ලක් කෙරේ.

**10.2.3 ජාතික මට්ටමට ඇගයීම් කුසලතා පිරිනැමීම**

අධ්‍යක්ෂ ජනරාල්ගේ පූර්ණ අධීක්ෂණය යටතේ අධ්‍යක්ෂ ක්ෂුද්‍ර මූල්‍ය ප්‍රධානත්වයෙන්.ජාතික මට්ටමට තේරී පත්වූ බැංකුව අයත්වන බැංකු කළමණාකරු බැංකු කාර්ය මණ්ඩලය, ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය හා පාලක මණ්ඩලය ද බැංකු සමිති කළමණාකරු හා ප්‍රාදේශීය ලේකම්ද ,බැංකුව අයත් වන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්,දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ හා බැංකු විෂය කළමණාකරු ද ඇගයීමට ලක් කෙරෙනු ඇත

**11 විශේෂ වැඩ සටහන් සඳහා දක්වන ලද දායකත්වය:-**

**11.1 වැඩිම ක්ෂේත්‍ර මුදල් ලැබීම් /සමිති ලැබීම්**

සළකා බලන කාළය තුළ **ජාතික මට්ටමේ තේරී පත්වන බැංකුවලින්** වැඩිම ක්ෂේත්‍ර ලැබීම් (සියළුම තැන්පත් හා ණය වාරික ඒකරාශි කිරීම) එකතු කළ **සමෘද්ධි සංවර්ධන නිළධාරීයා** ඇගයීමට ලක් කරනු ඇත.. දිස්ත්‍රික් මට්ටමින් වැඩිම ක්ෂේත්‍ර ලැබීම් එකතු කළ නිලධාරීයා තෝරා ප්‍රතිඵල ජාතික මට්ටමට ඉදිරිපත් කිරීම . දිස්ත්‍රික් අධ්‍යක්ෂ වරයා විසින් සිදු කළ යුතුය..(තොරතුරු ඉදිරිපත් කිරීමේදී ඉහත 8.2 ඡේදය අනුගමනය කළ යුතුය)

**11.2 වැඩිම ණය නිකුත් කිරිම :-**

පසුගිය වසර තුල ජාතික මට්ටමේ දිවයිනේ වැඩිම ණය නිකුත් කළ **සමෘද්ධි සංවර්ධන නිළධාරීයා** ඇගයීමට ලක් කරනු ඇත. එහිදී අදාළ වසමේ බොල්ණය අනුපාත 5%ට වඩා අඩු විය යුතු අතර කල් පසු වූ ණය අනුපාත 10% ට වඩා අඩු විය යුතුය. දිස්ත්‍රික් මට්ටමින් වැඩිම ණය නිකුත් කළ නිලධාරීයා තෝරා ප්‍රතිඵල ජාතික මට්ටමට ඉදිරිපත් කල යුතුය. මෙහිදී දිස්ත්‍රික්කයට ප්‍රධාන වගකීම පැවරෙනු ඇත. (තොරතුරු ඉදිරිපත් කිරීමේදී ඉහත 8.2 ඡේදය අනුගමනය කළයුතුය)

**11.3 . චක්‍රලේඛ මගින් හඳුන්වා දුන් විශේෂ වැඩසටහන්**

පසුගිය වසර තුල චක්‍රලේඛ මගින් හඳුන්වාදුන් අලුත් අවුරුදු ගණුදෙනු ඉතුරුම් වැඩසටහනේ දී වැඩිම දායකත්වයක් ලබාදුන් **සමෘද්ධි සංවර්ධන නිලධාරීයා** ජාතික මට්ටමේ ඇගයීමට කටයුතු කෙරෙනු ඇත. එහිදී ඒ ඒ දිස්ත්‍රික්කයෙන් අප වෙත වාර්තා කල තොරතුරු අනුව එම ඇගයීම් කටයුතු සිදු කෙරෙනු ඇත. (තොරතුරු ඉදිරිපත් කිරීමේදී ඉහත 8.2 ඡේදය අනුගමනය කළයුතුය)

ඉහත 11.1 ,11.2 හා 11.3 අනුව ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමින් කුසලතා පෙන්නුම් කළ නිළධාරින්ද ප්‍රාදේශීය හා දිස්ත්‍රික් ඇගයීම් වලදී ඇගයීමට ලක් කළ යුතු වේ.

**12**..මෙම කරුණුවලට අමතරව සුවිශේෂි දක්ෂතාවයන් දැක්වූ නිළධාරීන් සිටී නම් අදාල තොරතුරුද සමඟ ප්‍රධාන කාර්යාලය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය (උදා- ඇගයීම් කාලය තුළදී **විශාල වශයෙන් බොල් ණය** අය කර ගැනීමට කටයුතු කිරීම ආදී..).

**13. මෙම ඇගයීම් ප්‍රතිපල මත සමෘද්ධි බැංකු හා ඊට සම්බන්ධිත විශිෂ්ය සේවාවක් කල නිලධාරීන් සඳහා විශේෂ දිරි ගැන්වීම් හා ඇගයීම් ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමට යෝජිත බව ද සටහන් කරමි.**

**14. ඇගයීම් කටයුතු ක්‍රියාත්මක කලයුතු කාල පරාසය**

2018.01.01 - 2018.05.14 අතර කාල රාමුවක් ඉදිරිපත් කෙරේ. (ඇමුණුම අංක 03 මගින් ඉදිරිපත් කෙරේ.)

**15. සම්බන්ධිකරණය සහ පසු විපරම්**

අධ්‍යක්ෂ ජනරාල්ගේ උපදෙස් පරිදි අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) අධීක්ෂණය යටතේ තොරතුරු කළමනාකරණය ඒකකය.

**16. ත්‍යාග හා සහතික පත්‍ර ප්‍රදානය**

ඇගයීමට ලක් වන බැංකු, බැංකු සමිති හා ඊට අදාල නිලධාරින් වෙනුවෙන් පිරිනමනු ලබන ත්‍යාග හා සහතික පත් පිරිනැමීම සම්බන්ධයෙන් ඉදිරියේදී දැනුවත් කෙරෙන අතර, අමාත්‍යාංශ ලේකම් හා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ උපදෙස් පරිදි අධ්‍යක්ෂ ක්ෂුද්‍ර මූල්‍ය විසින් සංවිධානය කරනු ලබන ගරු විෂයභාර අමාත්‍යවරයා නියම කරනු ලබන දිනයකදී අතිගරු ජනාධිපතිතුමා, ගරු විෂයභාර අමාත්‍යතුමා, අමාත්‍යාංශ ලේකම් හා අධ්‍යක්ෂ ජනරාල්ගේ ප්‍රධානත්වයෙන් යුත් ජාතික උත්සවයකදී සිදුකරනු ලබයි.

**17. පොදු කරුණු**

17.1 මෙම අභිප්‍රේරණ ක්‍රියාවලිය වඩාත් සර්ව සාධාරණ ස්වාධින එකක් විය යුතු අතර, අදාල රාජකාරි පැවරෙන නිලධාරින් එය නිවැරදිව ක්‍රියාත්මක කල යුතු වේ.

17.2 අදාල ඇමුණුම් මගින් සියළු මගපෙන්වීම් සිදුකර ඇති අතර, අදාල උපදෙස් මනාව අවබෝධ කර කාර්යය ඉටු කර දිය යුතු වේ.

17.3 පත්කරන ලද ඇගයීම් කමිටු මණ්ඩල සාමාජිකයන් පවරනු ලබන රාජකාරි කොටස් නිවැරදිව ඔවුන් විසින් ඉටු කළ යුතු වේ.

මෙම ඇගයීම් කටයුතු ඉටුකිරිම වෙනුවෙන් ඔබට අතිරේක වශයෙන් වියදමක් දැරීමට සිදුවන්නේනම් ඒ සම්බන්ධයෙන් දළ ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත යුතුය. (අදාළ ඇස්තමේන්තුව චක්‍රලේඛන ප්‍රකාරව සාධාරණ විය යුතුය.)

මෙම අභිප්රේරණ ක්‍රමවේදය පියවරෙන් පියවර වැඩි දියුණු කරමින් ඉදිරියට ගෙන යාමට අපේක්ෂා කරන අතර සෑම වසරකම ඇගයීම් ක්‍රමවේදය අඛණ්ඩව සිදුකිරීමට අපේක්ෂා කෙරේ. තව ද මීට අමතරව සමස්ථ බැංකු පද්ධතියට අදාළ සියළු කාර්ය මණ්ඩලය සඳහා කාර්ය සාධන ඇගයීම් වැඩ සටහනක් මෙම වසර සිට ක්‍රියාත්මත කිරීමට සැලසුම් කරමින් පවතී . මෙහි සඳහන් කරුණු සම්බන්ධව කිසියම් ගැටළුවක් හෝ පැහැදිලි කිරීමක් හෝ වේ නම් පහත දුරකථන අංක අමතන මෙන් වැඩි දුරටත් දන්වා සිටිමි.

<u>තොරතුරු කලමණාකරණ ඒකකයේ දූරකථන අංකය</u>

**0112872227 - තොරතුරු කලමණාකරණ ඒකකය -කළමනාකරු - ඩබ්.රුක්මා මානෙල්**

**ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න**
**සමෘද්ධි ප්‍රජාමූල බැංකු කළමණාකරන මණ්ඩලයේ සභාපති/ අධ්‍යක්ෂ ජනරාල්**
**සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව**

**පිටපත් :-**

01. ලේකම්,සමාජ සවිබලගැන්වීම් සුබසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය. - කා.දැ.ගැ.පි
02. අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - කා.දැ.ගැ.පි
03. ප්‍රධාන ගණකාධිකාරි, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - දැ.ගැ.ස හා අ.ක.ස.
04. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - දැ.ගැ.ස හා අ.ක.ස
05. සියළුම අධ්‍යක්ෂවරුන් ඇතුළු අංශ ප්‍රධානීන්. - දැ.ගැ.ස.

ඇමුණුම **02**

**<u>සමෘද්ධි ප්‍රජාමූල බැංකු ශ්‍රේණිගත කිරීමේ හා ඇගයීම් වැඩසටහන-කමිටු සඳහා අනුමැතිය ලබාගැනීම.</u>**

**කමිටුව:- ප්‍රාදේශීය මට්ටම**

| නිලධාරියාගේ නම | තනතුර | සේවා ස්ථානය |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

ඉහත නම් සඳහන් නිලධාරීන් අදාල කමිටුවට නිර්දේශ කර අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි.

**ප්‍රාදේශීය ලේකම්.**

**අනුමත කරමි.**

**දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ**